සැකසුම - ඩබ්. ඩී. ශානිකා දිසානායක
ර/පලීගල විද්‍යාලය

## කාර්ය පත්‍රිකාව - 04 වන සතිය

- **නිපුණතාව 08** - **නර්තන කලාව හා අනෙකුත් කලාවන් අතර ඇති සහසම්බන්ධතාව අධ්‍යනය කරමින් තොරතුරු ඉදිරිපත් කරයි**
- **නිපුණතා මට්ටම 8.3** - **ශ්‍රී ලාංකීය නර්තනය හා චිත්‍ර කලාව අතර ඇති සහසම්බන්ධතාව පිළිබඳ අදහස් ඉදිරිපත් කරයි**
- **පාඩම** - **නර්තනය හා චිත්‍ර කලාව අතර සහසම්බන්ධතා විමසමු**

## I කොටස

**නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

(01) චිත්‍ර කලාවේ මූලිකාංග පමණක් අන්තර්ගත වරණය වන්නේ

(i) රේඛා, වර්ණ, හැඩ හා හැඩතල
(ii) වර්ණ, රේඛා, රිද්මය
(iii) හැඩ හා හැඩතල, තාලය
(iv) අවකාශය හා ආකෘතිය, රිද්මය

(02) නර්තනයේ අනුෂංගික අංග ඇතුළත් වරණය නොවන්නේ

(i) ගායනය, වාදනය, අංග රචනය, රංග වස්ත්‍රාභරණ
(ii) රංග වස්ත්‍රාභරණ,පසුබිම් අලංකරණය, වාදනය හා ගායනය
(iii) වාදනය, අංග රචනය, පසුබිම් අලංකරණය, ගායනය
(iv) හස්ත චලන, දණ්ඩි කඳ, මණ්ඩිය හා සිලම්බු

(03) ශාන්තිකර්ම ශිල්පීන් අතරින් චිත්‍ර කලාවේ මූලිකාංග වැඩි වශයෙන් යොදා ගන්නේ

(i) යක් ශාන්තිකර්ම ශිල්පියා ය
(ii) බලි ශාන්තිකර්ම ශිල්පියා ය
(iii) මඩු ශාන්තිකර්ම ශිල්පියා ය
(iv) දේව ශාන්තිකර්ම ශිල්පියා ය

(04) චිත්‍ර කලාව තුළ භාවිත වන්නේ රේඛා, හැඩ හා හැඩතල සුසංයෝගයෙන් සිදුවන අනුෂංගික අංගයක් නොවන්නේ

(i) අංග රචනය
(ii) රංග වස්ත්‍රාභරණ නිර්මාණය
(iii) රංග රචනය
(iv) පසුතල අලංකරණය

(05) නිර්මාණ එළි දැක්වීමේ දී චිත්‍ර කලාවේ මෙන්ම නර්තන කලාවේ දී
(i) විවිධ තල, දිසා, කෝණ හා ගැඹුර භාවිත කරයි
(ii) ලය, තාලය, දිසා, කෝණ හා ගැඹුර භාවිත කරයි
(iii) විවිධ තාල, මාත්‍රා, තිත හා දිසා භාවිතා කරයි
(iv) කෝණ, ලය, තල හා ගැඹුර භාවිත කරයි

**හිස්තැන් පුරවන්න**

(01) නර්තනයේ මූලික.......................................................................................... මානව චලනයකි.

(02) මානව චලනයේ භාවිතයෙන් අවකාශයේ ගොඩනැගෙන අඛණ්ඩ රූප පෙළගැස්ම ...................................
.............................................................................................. යි.

(03) ඇඹීමේ හා ඇඳීමේ කලාව වැඩිමනක් දැකිය හැකි ශාන්ති කර්මය ...............................................................
.......................................... යි .

(04) චිත්‍ර සම්පිණ්ඩනයේදී හා රංග වින්‍යාසයේදී.......................................................................................................
භාවිතය සිදුවේ.

(05) චිත්‍ර කලා නිර්මාණයක භාව ප්‍රකාශනයෙහි වෙනස ඒ සඳහා යොදා ගන්නා රළු රේඛා හා
.......................................................................................................................... රේඛා හැසිරවීමෙන් ප්‍රදර්ශනය වේ.

## II කොටස

**සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න**

(01) නර්තන කලාව සඳහා චිත්‍ර කලාවෙන් ලැබෙන පිටිවහල පිළිබඳ විමසීමක් කරන්න.

(02) නර්තන රංග රචනය හා චිත්‍ර සම්පිණ්ඩනය අතර ඇති සමාන රූපී ලක්ෂණ දෙකක් විස්තර කරන්න.

(03) ''බලි ශාන්තිකර්ම ශිල්පියා චිත්‍ර ශිල්පියෙකු ද වන්නේය. '' කරුණු දක්වමින් විමසන්න.